# දසත Dasatha

FREE

මාසික සංග්‍රහය. 2011 මාර්තු. 2 වෙළුම. 6 කලාපය www.dasatha.com



## ශ්‍රී ලංකා ක්‍රිකට් පිලට දසත උණුසුම් සුභ පැතුම් !


Find a Home of Your Dream

RE/MAX Diamond Realty Inc., Brokerage

'Beyond Your Expectations'

For ALL Your Real Estate Needs

Gamini Abeysinghe

Real Estate Sales Representative

Direct : 416 822 2789




NEW FOR THE HOLIDAYS!
$$ CASH $$ CASH $$
FOR YOUR GOLD & DIAMONDS
MENS DIAMOND RING
D.J.L SPECIAL $799
RETAIL PRICE $1700
10kt Gold 0.50ct tdw
DIAMOND HEART PENDANT
D.J.L SPECIAL $339
RETAIL PRICE $695
CHAIN INCLUDED
10kt Gold 0.25ct tdw
OPAL & TOPAZ RING
D.J.L SPECIAL $249
RETAIL PRICE $495
10kt Gold 0.05ct tdw
DIAMOND PENDANT
D.J.L SPECIAL $679
RETAIL PRICE $1375
CHAIN INCLUDED
14kt Gold 0.50ct tdw
DIAMOND RING
D.J.L SPECIAL $389
RETAIL PRICE $795
14kt Gold 0.33ct tdw
DIAMOND FLOWER PENDANT
D.J.L SPECIAL $449
RETAIL PRICE $1000
CHAIN INCLUDED
14kt Gold 0.50ct tdw
QUARTZ & DIAMOND RING & PENDANT SET
D.J.L SPECIAL $599
RETAIL PRICE $1290
14kt Gold 0.37ct tdw
BLACK & WHITE DIAMOND RING
D.J.L SPECIAL $999
RETAIL PRICE $2100
YOUR CHOICE
14kt Gold 1.00ct tdw
GEMSTONE RING
D.J.L SPECIAL $259
RETAIL PRICE $520
YOUR CHOICE
10kt Gold 0.20ct tdw
BLUE SAPPHIRE RING & EARRINGS
D.J.L SPECIAL $549
RETAIL PRICE $1100
14kt Gold 0.32ct tdw
D.J.L SPECIAL $739
RETAIL PRICE $1495
14kt Gold 0.50ct tdw
PEARL & BLACK DIAMOND EARRINGS
D.J.L SPECIAL $199
RETAIL PRICE $450
10kt Gold 0.38ct tdw
D.J.L SPECIAL $389
RETAIL PRICE $795
14kt Gold 0.20ct tdw
BLUE TOPAZ RING
D.J.L SPECIAL $679
RETAIL PRICE $1365
14kt Gold TOPAZ & AMETHYST
DIAMOND SLIDER PENDANT
D.J.L SPECIAL $449
RETAIL PRICE $900
CHAIN INCLUDED
10kt Gold 0.50ct tdw
GEMSTONE CIRCLE PENDANT
D.J.L SPECIAL $149
RETAIL PRICE $295
CHAIN INCLUDED
10kt Gold 0.10ct tdw
YOUR CHOICE
BLUE SAPPHIRE RING
D.J.L SPECIAL $399
RETAIL PRICE $795
YOUR CHOICE
10kt Gold 0.50ct tdw
BLUE TOPAZ & CHAMPAGNE DIAMOND RING & EARRINGS
D.J.L SPECIAL $739
RETAIL PRICE $1485
14kt Gold 0.33ct tdw
D.J.L SPECIAL $599
RETAIL PRICE $1240
CHAIN INCLUDED
14kt Gold 0.33ct tdw
INTRODUCING....
THE BARRY K COLLECTION
WHILE SUPPLIES LAST
ALL WATCHES
25% - 50% OFF
QUALITY
18KT Gold & Diamond Jewellery!
D.J.L
Diamond Jewellery Liquidators
OPEN 7 DAYS A WEEK
1111A Finch Ave. W.
(416) 661-9362
Mon-Fri: 10:30am - 6:30pm
Sat: 10am - 5:30pm
Sun: 11am - 4pm
VISIT
www.djljewellery.com
Steeles Ave
Finch Ave W
Keele St
Dufferin St
N
W
E
S
Sheppard Ave W
OVER 50% OFF
MERCHANDISE
SUGGESTED RETAIL




කතු වැකිය ............................................... 4
ආහාර පිළියෙල කිරීම සඳහා
රන් නියම 10ක් ........................................... 5
සිනමාවේ හා දේශපාලනයේ
අදත් නොපිරවුණු හිඩැස විජය ................... 7
නා ගහ ළඟ ගෙදර(නවකතාව) ................... 10
ශ්‍රී ලංකාවේ ප්‍රථම ක්‍රිකට් තරගය ............... 13
ලියාපදිංචි විශ්‍රාමික ඉතිරිකිරීම් සැලැස්ම
(RRSP)(Canada Tax) ................................. 15
නිරෝගි දිවියකට වෛද්‍ය උපදෙස් ............. 18
ගී මුතු වැල් ........................................... 19
තරු සිහිනය ජයගත් තරු කැකුළ
හිමාෂ මනුප්‍රිය ........................................ 20
යළි උපන් හදවත .................................... 25
නිසි තැන( කෙටිකතාව) ............................. 27
නොමියෙමි (කාව්‍ය)..................................... 28
සතුටු උයනට ගිය සිඟිත්තී (ළමා කතාව) ...... 31
ජනසිත් පොබ කළ
සිංහල කාටුන් ශිල්පියා විජේසෝම ............ 33
ඔබගේ දරුවාත් අධ්‍යාපන ගැටලුවලින්
පීඩා විඳින්නෙක්ද(සුව සෙත) ....................... 35
ශ්‍රී ලංකාවේ තීරණාත්මක
පුංචි ඡන්දය(විනිවිද) .................................. 37
කටට රහට කන මිරිස්. ............................. 38
හෙළ බසට වහ වැටුණු
ජර්මන් මහා පඬිවරයා ගයිගර් ................. 40
පේරාදෙණිය රජ මල්වත්ත ....................... 42



පිටුව - 7

සිංහල සිනමාවේ මේ අසහාය නළුවා මෑත කාලීන ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයෙහිද අතිශයින්ම ජනප්‍රිය චරිතයක් වූයේය. කුඩා කල සිට පැවති මානව හිතවාදී බවෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1977දී පැවති මහ මැතිවරණයේදී කටාන ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකයා වශයෙන් දේශපාලනයට පිවිසි ඔහුට එදා පැවති එජාප රැල්ලට යට වෙමින් පරාජය වන්නට සිදු විය.



පිටුව - 13

1882දී ප්‍රථම වරට සංචාරක එංගලන්ත කණ්ඩායමක් සමග ගාලුමුවදොර පිටියේදී තරග වැදීමට සමස්ත ලංකා පිළට හැකි වූයේ නැව් අනතුරක් නිසා පහළ වූ වාසනාවකිනි. ඕස්ට්‍රේලියාව බලා යමින් තිබූ එංගලන්ත ක්‍රිකට් කණ්ඩායම රැගත් නැව මොහොතකට කොළඹ වරායේ නවතා යළි ගමන් අරඹත්ම **පෙෂාවෝර්** නමැති එම නැවට පැමිණි අනතුරත් නිසා ආපසු ඊමට සිදු විය.



පිටුව - 35

මෙයට වඩා බහුල වන්නේ කියවීමේ ගැටලුවයි. ලිවීමේ ගැටලුව මෙන් එක්වරම අපට එය නොපෙනෙන නිසා එය හඳුනා ගැනීම ප්‍රමාද විය හැක. හඳුනා ගත්තද එහි බරපතල බව නිසි ලෙස අපට නොපෙනෙනු ඇත.මෙම කියවීමේ ගැටලුව අකුරු මට්ටමේදී (alphabetical error), වචන මට්ටමේදී (word level error) හා වාක්‍ය මට්ටමේදී (syntax error) දැකිය හැක.

දසත සඟරාවේ පළවන ලිපිවල අන්තර්ගතය ලේඛකයින් සතුයි.



Dasatha Publications
Free Issue Monthly Canada. March 2011

## මේ ව්‍යාධියෙන් අප ගැලවිය යුතුය

වර්තමානයෙහි කලාව මිනිසාගේ ජීවිතය හා අතිශයින්ම බද්ධව පවතින්නකි. කවිය, ගීතය, නාට්‍යය, සිනමාව, නවකතාව ආදි කලා මාධ්‍ය අතුරින් කුමකට හෝ සමීපව නොවෙසෙන මිනිසකු නැති තරම්ය. මෙනිසාම ජන විඥානයට පුළුල් අරුත් එක් කිරීමෙහි ලා කලාවට කළ හැකි මෙහෙවරද විශාලව පවතී. කලාවෙහි මේ ශක්‍යතාවෙන් වර්තමාන මිනිසුන් ප්‍රයෝජන ගන්නේද යන්න විමසා බැලිය යුතුය.

‘කලාව යනු මිනිස් දිවියමය’යි ලියෝ ටෝල්ස්ටෝයි වරෙක ප්‍රකාශ කළේය. ඔහු පමණක් නොව, පෙර අපර දෙදිගම ප්‍රබුද්ධ විචාරකයෝ මේ අදහස පිළිගනිති. ඉන් කියැවෙන්නේ මිනිස් දිවියේ විවිධ පැති විවරණය කිරීම, නිරූපණය කිරීම කලාව බවයි. එසේ නොමැතිව ජීවිතයේ එකම පැතිකඩත් අල්ලාගෙන ඒ පස්සේ දිවයාම කලාව නොවේ. එය ඒ පැතිකඩ පිළිබඳ ප්‍රචාරයක් පමණකි. තතු කෙසේ වුවද වර්තමානයේ ශ්‍රී ලංකාවේ බිහිවන සිංහල නවකතා කියවන කලත් ටෙලිනාට්‍ය නරඹන කලත් පෙනී යන්නේ කලාකරුවන් ලෙස තමන් හඳුන්වා ගන්නා ඒ අය කලාව වැරදි කොනින් අල්ලාගෙන ඇති බවය. ඔවුන්ගේ කෘතීන් සැමෙකකම වාගේ විවරණය වන්නේ ප්‍රේමයයි. ප්‍රේමය යන උත්තම වචනයෙහිද කොතෙක් නම් විවිධ හැඩරුව තිබේද? ඒවායින් තරුණ තරුණියන් අතර ඇතිවන බොළඳ ආදරයෙහි හැලහැප්පීම් පිටු සියය හමාර ලියැවුණු නවකතාවලිනුත් පැය භාගයේ කොටස්(Episode) සිය ගණනක් පුරා විහිදුණු ටෙලිනාට්‍යවලිනුත්, පැය එකහමාරක් දෙකක් පුරා දිවෙන චිත්‍රපටවලිනුත් ඉදිරිපත් කිරීමට මේ කලාකරුවෝ පෙළඹී සිටිති. මේවායින් ජනවිඥානය පටු කිරීමට මිස පුළුල් කිරීමට ලැබෙන පිටිවහල කුමක්ද? ජීවිතයේ දහසකුත් එකක් පැති කෙරේ තම අවධානය යොමු කිරීමට තරම් පරිණත බවක්, උසස් පෙළේ උපකල්පනයක් මේ අය සතුව නොමැති වීම අවාසනාවකි.

මෙපමණක්ද නොවේ, සම්මාන පිරිනැමීම සඳහා මේවා විමර්ශනයට ලක් කරන්නෝද ඉතා පටුතලයක හිඳ ඉඳහිට හෝ මෙයින් බැහැර වූ හොඳ කෘතීන් ඇතත් ඒවා පිටුදකිමින් මේවාටම සම්මාන හිමි කිරීමද අවසානාවක්ම නොවන්නේද? එය ගතවූ අවුරුදුවල රාජ්‍ය සම්මාන උළෙල ඇතුළු විවිධ උළෙලවල්වලදී සම්මාන දීම දෙස බැලීමෙන්ම පෙනී යයි.

ඒ නිසා අපේ රටේ අපේ කලා නිර්මාණ දවසින් දවස උසස් තලයකට ගෙන ඒමේ අවශ්‍යතාව සිංහල කලාකරුවන් වටහා ගත යුතුව ඇත. ඒ සඳහා අවශ්‍ය ශික්ෂණයත් පරිණත බවත් ඔවුන් විසින් ලබා ගත යුතුය. බොළඳ මානසිකත්වයකින් ජනතාව ගලවා ගනු වස් ජීවිත පරිඥාණය පුළුල් කරනු ලබන ජීවිතයේ විවිධ පැති අලලා සැකසුණු උසස් කලා කෘතීන් ඔවුන් විසින් සමාජයට උරුම කොට දිය යුතු කාලය එළඹ තිබේ. උසස් කලා නිර්මාණයන් රස විඳීමට සැදී පැහැදී සිටින සුවහසක් කලා රසිකයන්ගේ රසඥතාවයට ගෝචරවන පරිදි තම කලා නිර්මාණයන් එළිදැක්වීමට අපගේ කලාකරුවන්ට ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු



සංස්කාරක

Consultant Editors
Well known Writer
Sirisena Vithanage
Ex Additional secretary,
Ministry of Education

Veteran journalist
Sujeewa Disanayake
Ex Chief Editor Silumina News Paper

Editor in Chief
Chamari Abeysinghe

Associate Editor
Nandana Prasadh

Graphic Design & Layout
Chamari Abeysinghe

Creative graphics
Jagath Hewapanna

Web Master
Dhanushka Bandara

Editorial Assistant
Gamini Abeysinghe

**Contact Us**
**Publisher**
**Dasatha Publications**
**1709-260 Scarlett Rd**
**Toronto, Ontario**
**M6N 4X6 Canada**

**Telephone : 416 822 2789**
**Fax : 416 241 3391**
**E-Mail : dasathainfo@gmail.com**
**Web : www.dasatha.com**

# ආහාර පිළියෙල කිරීම සඳහා රන් නියම 10ක්





පෝෂ්‍යදායි ආහාර ගැනීම එකකි. එම ආහාර ස්වස්ථතානුකූලව පිළියෙල කර ගැනීම තව එකකි. මෙහි දැක්වෙන්නේ ආහාර පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු යැයි ලෝක සෞඛ්‍ය සංවිධාන නිර්දේශ කළ නියමයන්ය.

**1. අලුත් හෝ නියමිත ලෙස සැකසූ ආහාර තෝරා ගන්න**

එළවළු හා පලතුරු වැනි ආහාර අලුතෙන්ම ලබාගත හැකිනම් ඒවා පෝෂණ ගුණයෙන් උසස් බව අපි දනිමු. එහෙත් හැම ආහාරයක්ම එසේ නොවේ. ඒවා අලුත් පිට ගන්නවාට වඩා කිසියම් සකස්කිරීමකට ලක් කළ පසු ගැනීම වඩා යහපත්ය. උදාහරණ-එළකිරි අමුවෙන් ගන්නවාට වඩා පැස්චරීකරණය කළ එළකිරි ගැනීම යහපත්ය. බොහෝ ආහාර වර්ග, විශේෂයෙන්ම පලතුරු හා එළවළු ආහාරයට ගැනීමට පෙර හොඳින් සේදීම අත්‍යවශ්‍යය.

**2. ආහාර හොඳින් පිසින්න**

බොහෝ අමු ආහාර විශේෂයෙන්ම මස්, මාළු, කිරි යනාදිය රෝගකාරක විෂබීජ මගින් දූෂණය වී තිබිය හැකිය. මෙම රෝගකාරක විනාශ කර දැමීමට ඇති හොඳම මග හොඳින් පිසීමය. එහෙත් මෙහිදී ආහාරයේ සෑම කොටසක්ම අඩු තරමින් සෙල්සියස් අංශක 70ක උෂ්ණත්වයට පත් කළ යුතු බව මතක තබා ගන්න. විශේෂයෙන් මස් කුට්ටි මැද සහ අස්ථි අසල හොඳින් තැම්බීම සඳහා වෑංජනය මිනිත්තු 8-10ක් තරම්වත් නටන උෂ්ණත්වයේ තිබිය යුතුය.
අධි ශීත තත්ත්වයෙන් ගෙදරට ගෙන ආ මස් හා මාළු වර්ග ආහාරයට පිළියෙල කිරීමට පෙර හොඳින් ශීත මිදීමට ලක් කළ යුතුය.

**3. පිසූ ආහාර ඉක්මනින් ආහාරයට ගන්න**

පිසූ ආහාර ලිපෙන් බෑමෙන් පසු සාමාන්‍ය උෂ්ණත්වයක තිබුනහොත් ඉක්මනින් ඒ මත විෂබීජ වර්ධනය විය හැකිය. මේ නිසා පිසූ ආහාර හැකි ඉක්මනින් ආහාරයට ගත යුතුය.

**4. පිසූ ආහාර හොඳින් ගබඩා කර තබන්න**

සකස් කළ ආහාර ඉක්මනින් ආහාරයට නොගෙන පසුවට ගැනීමට තබන්නේ නම් ඒවා රස්නයෙන්(සෙල්සියස් අංශක 60කට වැඩි උෂ්ණත්වයක) හෝ ශීතලව(සෙල්සියස් අංශක 10 හෝ ඊට අඩු හෝ) තැබිය යුතුය. පැය 4-5කට වඩා තබා ගන්නා ආහාර සඳහා මෙම නියමය වඩාත් බල පැවැත්වෙයි.

**5. පිසූ ආහාර පසුව ගන්නේ නම් යළිත් හොඳින් රත් කරන්න**

පිසූ ආහාර තිබෙන්නට හැර පසුව ආහාරයට ගන්නේනම් එහි ඇති විෂබීජ ඔබට හානියක් නොකරන්නට නම් නැවතත් සෙල්සියස් අංශක 70 දක්වා ඒවා උණුසුම් කරන්න.

**6. අමු ආහාර සහ පිසූ ආහාර එක සමීපයේ නොතබන්න**

අමු ආහාර සමග යාන්තමින් ස්පර්ශ වුවද පිසූ ආහාර දූෂිත විය හැකිය. විශේෂයෙන් ශීතකරණයක තබන විට පවා මාළු හා එළවළු එකම තට්ටුවක නොතබන්න. විශේෂයෙන්ම මස් කැපීමට ගත් පිහිය, ලෑල්ල යනාදිය වෙනත් ආහාරයක් කැපීමට යොදා ගැනීමට පෙර ඒවා හොඳින් සෝදා ගන්න.

**7. දෑත් හොඳින් සෝදා ගන්න**

ආහාර සකස් කිරීමට පළමුව සබන් දමා දෑත් හොඳට සෝදා ගන්න. ආහාර සැකසීම නවතා වෙනත් කාර්යයකට ගොස් නැවත ආහාර සකස් කිරීමට යන සෑම විටකදීම පෙර සේම සබන් දමා දෑත් හොඳින් සෝදාගන්න. මස් වර්ගයක් පිළියෙල කළ පසුව වෙනත් ආහාරයක් විශේෂයෙන් සලාද, මැල්ලුම්, පළතුරු සලාද වැනි දෑ පිළියෙල කිරීමට ඇත්නම් එක දිගටම ආහාර සකස් කිරීමේ යෙදෙන විට පවා දෑත් සබන් දමා හොඳින් සෝදා ගන්න. දරුවකු පිරිසිදු කිරීමට දරුවාගේ ඇඳුම් මාරු කිරීමට ගිය විටකදීද මෙය අමතක නොකළ යුත්තකි.

**8. විශේෂයෙන්ම ආහාර පිළියෙල කිරීමට ගන්නා මේසය, කපන ලෑල්ල, පිඟන්, පිහිය, හැඳි ආදිය පිරිසිදු කරගන්න. කුස්සියේ පොළව විශේෂයෙන්ම පිරිසිදු විය යුතුය.**

**9. ආහාර කෘමීන් හා සතුන්ගෙන් ආරක්ෂා කරගන්න**

මීයන්, කැරපොත්තන්, හූනන්, මැස්සන්, කෝඳුරුවන් ආදි සතුන් බොහෝ ගණනක් පිළියෙල කළ ආහාරවලට මෙන්ම අලුත් ආහාර මතටද රෝගකාරක හා වෙනත් අපිරිසිදු දෑ ගෙන ඒමට සමත්ය. මෙවැනි සතුන්ට ළංවීමට නොහැකි සේ ආහාර තැබීමට වග බලා ගන්න.

**10. පිරිසිදු වතුරම භාවිත කරන්න. ආහාර පිළියෙළ කිරීමට සහ ඒවා පිළියෙළ කරන මෙවලම්(හැලි වළං ආදි) සේදීම සඳහාද පිරිසිදු වතුර පමණක්ම භාවිත කරන්න.**

සෞඛ්‍ය මාධ්‍යවේදී
තුසිත මලලසේකර විසිනි




## අඩුම මිලට හොඳම දේවල් ඔබගේ සිතැගි පරිදී තෝරාගන්න

### සහල් වර්ග

Red Lantl
Sanba Rice
Basmathi Rice
Ponni Rice

### බිස්කට් වර්ග

මැලිබන්
මන්චි නයිස්
ජින්ජර් නට්

### නැවුම්(Fresh) පලා වර්ග

ගොටුකොළ
මුකුණුවැන්න
කතුරුමුරුංගා

එළු මස්
කුකුල් මස්
ඇතුලු සියලුම
මස් වර්ග

Ovaltine
Lakspray
Nespray ඇතලු
සියළුම කිරි පිටි වර්ග

Maldive Fish
Steamed Flour
Red Masoor Dhal
Chili Powder

### කරවල වර්ග

තෝරා
කට්ටා
බොම්බෙලි
කූනිස්සෝ

Harischandra,MD, Larich, M&M
Delmage ඇතලු
සියළුම නිෂ්පාදන වර්ග

අලුත් මාලු
අලුත් එළවළු
සහ පළතුරු

**GNANAHS MARKET**

**44A DEAN St BRAMPTON, ON L6W 1M6 (Also accessible from 105 Kennedy Rd.S)**

**TEL: 905 455 8228**





# සිනමාවේ හා දේශපාලනයේ අදත් නොපිරවුණු හිඩැස විජය

විජය කුමාරතුංග අප අතරින් වියෝ වී මේ ගතවන්නේ 24වැනි වසරයි. 1988 පෙබරවාරි 16වනදා සාහසිකයකුගේ කුරිරු වෙඩි පහරකින් මෙලොවින් වෙන්ව යාමට විජයට සිදු විය. මෙම ලිපිය විජය කුමාරතුංග මතකය අවදි කරනු පිණිස ලියැවෙන්නකි.

ජීප සමාජයෙහි අපමණ මිනිස්සු උපදිති. ඔවුන්ගෙන් ඇතැමෙක් ලොවට කිසියම් මෙහෙවරක් කොට මිය යන්නෝය. තවත් සමහරෙක් උපන්නාට මේ ලොව වැනෙන්නෝය. විජය කුමාරතුංගයන් මින් පළමු ගණයට අයත් වූවෙකි. විජය මේ ලොව උපන්නේය. සිනමා ක්ෂේත්‍රයෙහිත් දේශපාලන ක්ෂේත්‍රයෙහිත් නොමැකෙන නමක් තබා මිය ගියේය.

විජය උපන්නේ 1945 ඔක්තෝම්බර් 9වැනිදාය. සීදූවේ බෙන්ජමින් කුමාරතුංග සහ බියට්‍රිස් කුමාරතුංග ඔහුගේ මාපියෝය. පුතුට නම් තැබුණේ කෝවිලගේ විජය ඇන්ටන් කුමාරතුංග යනුවෙනි. මේ පුතු මිය යන අවස්ථාව වන විට පැවති තත්ත්වයට පැමිණේයැයි එදා ඒ දෙමාපියන් සිතන්නට නැතිවා නිසැකය. එහෙත් එය එලෙස සිදු වූයේය.

## ළමා විය

මුලදී සීදූව පාසලින් ඉගෙනීම ඇරඹූ විජය පස්වන පන්තියෙන් පසුව කොටහේන ශාන්ත බෙනඩික් විද්‍යාලයටත් පසුව කඳාන ද මැසනඩ් විද්‍යාලයටත් ඇතුළත් කෙරිණි. මේ පාසල්වලදී කථිකයකු හැටියටත්, ක්‍රිකට්,පාපන්දු, රගර්, බාස්කට් බෝල් ආදි ක්‍රීඩා ශූරයකු හැටියටත් තම දස්කම් විදහා දැක්වීමට ඔහුට හැකි විය. මේ සියල්ලටම වඩා පාසලේ සියලු සිසුන් අතර විජය කැපී පෙනුණේ උසස් පෙළේ මානවවාදියකු හැටියටය. අනුන්ගේ දුකෙහිදී කම්පා වන ගුණය පාසල් අවදියේ සිටම විජයගෙන් ප්‍රදර්ශනය වූයේය. නව යෞවනයේදීම ඔහු ලේ දන් දුන්නේය. මිතුරන්ගේ නැතිබැරි අවස්ථාවල ඔවුන්ට පිහිට වූයේය. පාසලේදී තමන් නොකා සිට අනුන්ට තම වේල දන් දුන් අවස්ථා අපමණ විය. ‘හැදෙන ගහ පෙත්තෙන් දෙපෙත්තෙන් දැනේය’යි කී සිංහල පිරුළ පරිදි පසු කලෙක ඔහු තුළ මෝරා ගිය මානවහිතවාදිත්වයෙහි බීජාවස්ථාව එය විය.

## කලා අධ්‍යාපනය

මේ අතර ඔහු තුළ වූ කලාකාමිත්වය හා හැකියාවද පාසල් වියේදීම ප්‍රකට කළේය. ජ්‍යෙෂ්ඨ විභාගය සමත් වීමේදී චිත්‍රකර්ම විෂයයට විශිෂ්ට සම්මානයක් හිමිකර ගැනීමට ඔහුට හැකි වූ අතර පාසල්වල කලා කටයුතුවලදී ඔහු උද්‍යෝගයෙන් වැඩ කළේය. මුලදී සමසමාජ පුවත්පතේ අලෙවි නියෝජිතවරයෙකු වශයෙනුත් පසුව පෞද්ගලික ආයතනයක ගෘහ නිර්මාණ ශිල්පියකු වශයෙනුත් රැකියාව කළ විජයගේ කලා ජීවිතයේ උල්පත මතු වූයේ සෙරන්ඩිබ් කලායතනයේ නැටුම් හා රංගන පාඨමාලාව හැදෑරීමත් සමගය. ශේෂා පලිහක්කාර නැටුමිනුත් පී. වැලිකල හා ජේ.එච් ජයවර්ධන රංගනයෙනුත් ඔහු පොහොසත් කළේය.

## සිනමාව

ටයිටස් තොටවත්තයන් අධ්‍යක්ෂණය කළ පුරන් අප්පු චිත්‍රපටය මෙකල සෙරන්ඩිබ් කලායතනය මූලිකව නිපදවෙමින් තිබිණ. එහි රඟපෑමේ අවස්ථාව විජයට උදා විය. අවාසනාවකට මෙන් පුරන් අප්පු චිත්‍රපටයේ නිෂ්පාදන කටයුතු අතරමග නතර වූයේන් කෙටි

සිරිසේන විතානගේ විසිනි

කලක් සිනමාවෙන් ඈත්ව සිටින්නට ඔහුට සිදු විය. මේ කාලය තුළ කලාවෙන් ඈත් නොවූ විජය ප්‍රේමසිරි කේමදාසයන්ගේ සංගීත මංජරියට එක්ව එහි ගීත නාටකවල රඟපෑවේය. **හන්තානේ කතාව** චිත්‍රපටයට නළුනිළියන් ඉල්ලා පුවත්පත් දැන්වීමක් පළවූයේ මේ කාලයේදීය. එයට ඉල්ලුම් කළ විජයට එහි ප්‍රධාන චරිතය රඟපෑමේ අවස්ථාව ලැබිණි. එහෙත් විජය සිනමා ප්‍රේක්ෂක ජනතාව අතරට මුලින්ම පැමිණියේ හන්තානේ කතාවට පෙර තිරගත වූ **රෝමියෝ ජූලියට්** චිත්‍රපටයෙනි. මෙතැන් සිට විජයගේ සාර්ථක රංගනය නිසාම අධ්‍යක්ෂවරුන්ට ඔහු අත නොහැර බැරි සිනමා චරිතයක් බවට පත් විය.



ගඟ අද්දර සිනමාපටයෙහි ගීත පටිගත කරන විජය ඇතුලු පිරිස

විජය රඟපෑ මුළු චිත්‍රපට සංඛ්‍යාව සියය ඉක්මවීය. ඒ අතරින් හන්තානේ කතාව, මේ දැස කුමටද?, ආදරේ හිතෙනව දැක්කම, තුෂාරා, දූලිකා, අහස් ගව්ව, සිකුරුලියා, උන්නත් දාහයි මලත් දාහයි, මරුවා සමග වාසේ, පොඩි මල්ලී, පෙම්බර මධූ, එයා දැන් ලොකු ළමයෙක්, බඹරු ඇවිත්, හිඟන කොල්ලා, පාර දිගේ, මොණරතැන්න, ගඟ අද්දර, කරුමක්කාරයෝ, බැද්දේගම, මහගෙදර, දොළොස්මහේ පහන, දෙව්දූව, යස ඉසුරු, පාරමිතා, කැඩපතක ඡායා, ක්‍රිස්තු චරිතය ආදි චිත්‍රපට සිංහල සිනමාව ප්‍රේක්ෂක රුචිය අතින් උසස් තලයකට ගෙන ඒමට බෙහෙවින් දායක විය.

මරුවා සමග වාසේ, පොඩි මල්ලි, මහගෙදර, දෙව්දූව, කැඩපතක ඡායා, දොළොස්මහේ පහන ආදි චිත්‍රපට රැසකටම රංගනය වෙනුවෙන් සම්මාන දිනා ගැනීමට ඔහු සමත් විය. සරසවිය සිනමා පුවත්පත මගින් පැවැත්වුණු සිනමා සම්මාන උළෙලේ 1983/ 84/ 85/ 86/ 87/ 88 යන වර්ෂයන්හි ජනප්‍රියම නළුවාට හිමි සම්මානය නොකඩවා දිනා ගැනීමට විජය සමත් වීමෙන්ම ඔහු මහජනයා අතර කොපමණ ජනප්‍රිය වූවෙක්දැයි අපට සිතා ගත හැකිය. එමෙන්ම 1988 වර්ෂයේදී සරසවි සම්මාන උළෙලේදී රණතිසර සම්මානයෙන්ද විජය පිදුම් ලැබූහ.

ඇතැම් විටක ඔහු රඟපෑ චිත්‍රපටවලට ගායනයෙන්ද දායක වූ විජය සරල ගී ගායනයටද පිවිසියේය. ඔහුගේ මුල්ම ගීතය **රුස්ස ගහ යට පාළු මාවතේ** නම් ගීතයයි. ඉන් අනතුරුව අතිශය ජනප්‍රිය ගීත රැසක්ම ඔහුගේ ගායන කෞශල්‍යයෙන් ඔපවත් විය. විජය තම ගායන කුසලතාව වෙනුවෙන් සරසවි සම්මාන උළෙලේදී දෙවරක්ම හොඳම ගායකයා ලෙසින්ද සම්මානයට පාත්‍ර විය. ඒ 1991 සම්මාන උළෙලේදී **දොළොස්මහේ පහන** සිනමා පටයෙහි **පෙමක සුවඳ දැනිලා** ගීතයට සහ 1992 වසරේ සම්මාන උළෙලේදී **සහරාවේ සිහිනය** සිනමා පටයෙහි **වලාකුළක් ගෙන මුවා කරමු හිරු** ගීතය වෙනුවෙන්ය. නමුත් අවාසනාවකට මෙන් මේ වන විට විජය ජීවතුන් අතර සිටියේ නැත.

දේශපාලනය

සිංහල සිනමාවේ මේ අසහාය නළුවා මෑත කාලීන ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයෙහිද අතිශයින්ම ජනප්‍රිය චරිතයක් වූයේය. කුඩා කල සිට පැවති මානව හිතවාදී බවෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1977දී පැවති මහ මැතිවරණයේදී කටාන ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකයා වශයෙන් දේශපාලනයට පිවිසි ඔහුට එදා පැවති එජාප රැල්ලට යට වෙමින් පරාජය වන්නට සිදු විය. පරාජයෙන් පසුබට නොවූ විජය දිගටම දේශපාලනයෙහි රැඳී සිටියේය. 77 බලයට පත් රජය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ප්‍රජා අයිතිවාසිකම් අහෝසි කළ අවස්ථාවේදී රට පුරා පැවැත්වුණු විරෝධතා ව්‍යාපාරයන්හි නායකත්වය ගෙන ක්‍රියා කළේ විජයයි. 1982 පැවති ජනාධිපතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂකයා වූ හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ මැතිවරණ සටනේ මෙහෙයුම්කරු වූයේද ඔහුයි. මේ ජනාධිපතිවරණයෙන් කොබ්බෑකඩුව පැරදුනද විජය පිළිබඳ අනාගත බියකින් පෙළුණු එජාපය ඔහුගේ දේශපාලන ගමන් මග අහුරනු සඳහා නක්සලයිට් කුමන්ත්‍රණ චෝදනා මත 1982 නොවැම්බර් 19 වෙනිදා ඔහු අත්අඩංගුවට ගෙන සිර කර තැබිය. ඒ පිළිබඳ නඩුවේදී ඔහුට විරුද්ධ චෝදනා ඔප්පු කර ගත නොහැකි වූයෙන් 1983 ජනවාරි 18දා නිදහස ලැබීමට ඔහු සමත් විය. 1984දී ශ්‍රී ලංකා මහජන පක්ෂය අරඹමින් තම දේශපාලන ගමන් මග තීව්‍ර කළ විජය මිය යන තෙක්ම පොදු ජනයා වෙනුවෙන් වූ එම දේශපාලන ගමන ගියේය.



සරසවි සම්මාන උළෙලකට පැමිණෙන විජය චන්ද්‍රිකා සහ දරු දෙදෙනා

විජය කුමාරතුංගයන්ගේ දේශපාලන ගමන් මගට අතිශය සමීප සාධකය වූයේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියයි. දෙදෙනා විවාහයෙන් බැඳුණේද දේශපාලනය නිසාමය. 1977 මැතිවරණ සමයේදී දෙදෙනා එක්ව කටයුතු කළ අතර මැතිවරණය නිමා වන විට දෙදෙනා පෙමින් වෙළී සිටියහ. 1978 පෙබරවාරි 20දා දෙපසෙහිම ආශිර්වාද ලබමින් විවාහ දිවියට එළඹියේය. "මම චන්ද්‍රිකා සමග විවාහ වූයේ ඇය මා තේරුම් ගත් එකම තැනැත්තිය වූ නිසයි" විජය වරෙක සඳහන් කළේය. විජය සිරගතව සිටියදී ඔහු වෙනුවෙන් ඇය කළ කැප වීම මැනවින් කැපී පෙනුණේය. යශෝධරා දියණිය සහ විමුක්ති පුතණුවන් විජයගේ ලෝකය තව



1986දී ශ්‍රී ලංකා මහජන පක්ෂ නායක විජය කුමාරතුංග, චන්ද්‍රිකා සහ ඔසී අබේගුණසේකර ඇතුළු පිරිස මදුරාසියේදී EPRLF නායකයන් හමු වූ අවස්ථාව



විජය සාමාන්‍ය මහජනයා සමග ගැවසීමට අතිශය ප්‍රිය කළ පුද්ගලයෙකි දේශපාලන රැලියක් අතරතුර විජය මිනිසුන් අතරට ගිය අවස්ථාවක්

තවත් ආලෝකවත් කළපහන් තරු දෙකක් බඳු විය. ඔහු සිරගෙදර සිටි අවදියේ සිඟිති දරුවන් වෙත ලිපි ලියා එවූ බවද නොරහසකි. ඔහුගේ අවසන් මොහොතේදීද ඔහු දෑතේ තිබුණේ සිඟිති දියණිය යශෝධරාවන් විසින් ඇඳි සිතුවමකි. විජය තම දරුවන්ට පන මෙන් ආදරය කළ පියෙකි. තම මැණියන්ට පන මෙන් ආදරය කළ පුතෙකි.

ශ්‍රී ලංකාවේ සෑම කල්හිම සිදුවන්නේ අයුක්තිය අසාධාරණය වෙනුවෙන් කැප වූවන් ඝාතනයෙන් මර්ධනය කිරීමය. මේ න්‍යායයට අනුව ජාතික නායකයකු බවට පත් වූ විජය කුමාරතුංගයන් අමානුෂික ලෙසින් ඝාතනය කෙරිණි. විජයට ගිනි අවිය එල්ල කළ ඝාතකයා සොයා ගත් නමුත් තවමත් මේ අවිහිංසක සමනළයා මරා දැමූ නියම ඝාතකයන් කවුරුන්දැයි අනාවරණය වී නොමැත. එසේ වුවද එය බලය මූලික කොට ගත් තවත් ඝාතනයක් බව නම් පැහැදිලිය.